චක්‍රලේඛ අංකය: 7/2015

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/ 1/ 2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

දිනය / திகதி / Date: 2015/09/ 15

සියළුම ප්‍රාදේශිය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**කියවීමේ දුෂ්කරතා සහිත විවාහ, උප්පැන්න සහ මරණ ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීම**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල තැම්පත් කර ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලේඛන ලියාපදිංචි කර ඇති අක්ෂරවල පවතින අපැහැදිළි තත්වයන් හේතුවෙන් මහජනයා දුෂ්කරතාවයන්ට පත්වන අවස්ථා පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්මේලනයේදී සාකච්ඡාවට බඳුන් විය. මෙහිදී ප්‍රධාන ගැටළුවක් වශයෙන් අනාවරණයවී ඇත්තේ, ලියාපදිංචි කර ඇති ලේඛනවල බැඳි අකුරු ලියා තිබීමෙන් ඒවා කියවීමේ අපහසුතා ඇතිවීමය.

02. එබැවින් ලියාපදිංචි ලේඛනවල ඇති අක්ෂරවල අපැහැදිළිතාවය නිසා මහජනයාට සිදුවිය හැකි දුෂ්කරතා අවමකරනුවස් පහත පරිදි කටයුතු කරන ලෙස උපදෙස් දෙමි.

I. එකට බැඳුනු අපැහැදිළි අක්ෂරවලින් ලියාපදිංචි කර ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලේඛනවල පැහැදිළි සහතික පිටපත් අයදුම්කරුවන් විසින් ඉල්ලා සිටින විටදී, අදාල අයදුම්පත සමග ලිඛිත ඉල්ලීම් ලිපියක්ද ලබාගෙන, සහතික පිටපතක් සඳහා වන නියමිත ගාස්තුව අයකරගෙන, අදාළ ආරක්ෂිත ආකෘතියක පැහැදිළි අකුරින් පිටපත් කර, නියමිත පරිදි සහතික කර, සහතිකය නිකුත් කිරීම.

II. විවාහ, උප්පැන්න සහ මරණ ලේඛනයක සඳහන් තොරතුරු කියවීමට නොහැකිවීම, අපැහැදිළිවීම යන කරුණු නිසා පැහැදිළි අකුරුවලින් ලියූ සහතිකයක අවශ්‍යතාවයක් නිරීක්ෂණයවේ නම්, උප්පැන්න මරණ පනතේ 13 වගන්තිය ප්‍රකාර නව සහතිකයක් තැබීමට කටයුතු කිරීම සඳහා ප්‍රකාශ පත්‍රයක් ඊට අදාල ලියවිලිද සමග අවශ්‍ය නිර්දේශය ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම.

03. ඉහත අනුව කටයුතු කිරීමට අවශ්‍ය ආරක්ෂිත ආකෘති පත්‍ර සහ 13 වගන්තිය යටතේ ප්‍රකාශ පත්‍ර අවශ්‍ය පරිදි කාර්යාලයේ ගබඩා කර තබාගැනීමට පියවර ගන්නා ලෙසද කාරුණිකව දන්වමි

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. සියළුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිසට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
3. සියළුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
4. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.